උ. ප. රා. සේ.කො. චක්‍ර ලේඛ අංක 04/2019

මගේ අංක NP/07/10/01/123
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය.
18.03.2019

ලේකම් මුදල් සැලසුම් හා පළාත් පාලන අමාත්‍යාංශය
කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් ප්‍ර.පළා.කො.කාර්යාල
කොමසාරිස් - මහ නගර සභා, ලේකම්වරු - නගර සභා සහ ප්‍රාදේශීය සභා
උතුරු පළාත

# උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආදායම් පරීක්ෂක III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019

උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආදායම් පරීක්ෂක III වැනි ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් 2019 මැයි මස යාපනයේ දී පැවැත්වීමට නියමිත බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 18.04.2019 වේ.

## 02 බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1. 2013.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ආදායම් පරීක්ෂක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ නිර්දේශිත කොන්දේසි සහ එම සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ මතු පැමිණෙන කාලවලදී සිදු කරනු ලබන සංශෝධන වලටද, උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ, අංක **G/NPC/A4/LG/Approval/17/2018** හා 2018.11.30 වැනි දින දරණ ලිපිය මගින් ලබාදී ඇති අනුමැතිය ප්‍රකාරද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා සමාජවාදී ජන රජයේ අංක 1817/30 සහ 2013.07.03 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන සංග්‍රහයේ කාර්ය පටිපාටික රීතීන්ට අනුකූලව තෝරා ගන්නා අයදුම්කරුවන් අදායම් පරීක්ෂක 111 වැනි ශ්‍රේණියේ තනතුරට පත්කිරීමට නියමිතය.

02.2. මෙම විභාගයෙන් සමත් වන අපේක්ෂකයන් ආදායම් පරීක්ෂක 111 වැනි ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ මෙම තනතුර වසරක පරිවාස කාලයට යටත් වන අතර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වේ. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි උතුරු පළාත් ආදායම් පරීක්ෂක 111 වැනි ශ්‍රේණියට බඳවා ගන්නා දින සිට වසර 03 ක් ඇතුලත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුයි.

02.3. මෙම සේවය ස්ථානමාරු ඇතුළත් සේවයක් වන බැවින් මෙම තනතුරට පත්වන අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දේසියට යටත්විය යුතුය.

02.4. එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අපේක්ෂකයා එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළ යුතුයි යන කොන්දේසිය අනිවාර්ය වේ.

02.5. රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 සහ ඉන් අනතුරුව නිකුත් කරනු ලබන චක්‍ර ලේඛ ප්‍රකාර පත්වීම් ලබන දින සිට වසර 05 ක් අවසන්වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂාව සමත්විය යුතුය.

02.6. පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක කරනු ලබන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. ඇතැම් පුරප්පාඩු හෝ සියලුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

03 **සුදුසුකම් :**

03.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව, පහත සඳහන් වැටුප් සංකේතයන්හි වැටුප් ලබන්නෙකු විය යුතුය. PL -1-2016, PL-2-2016, PL-3- 2016, MN-1-2016.

03.2. පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් කාර්යාලවල (Officers under the Local Government Department) මෙම තනතුරට අදාළ සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ ඇමුණුම-V (Annexture- V) හි සඳහන් කුමක් හෝ ස්ථිර තනතුරක අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට ප්‍රථම සේවය ස්ථිරකර තිබිය යුතු අතර අයදුම්පත් යොමු කරන දිනට වසර 05 ක අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

03.3. 2013.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අනුමත ආදායම් පරීක්ෂක තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇමුණුම් V හි (Annexture-V) සඳහන් කාණ්ඩ වලට අයත් නිලධරයන් පමණක් මෙම තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් ලබති. මේ පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානිය සෑහීමට පත්විය යුතුයි.

03.4. අධ්‍යයන පොදු සහතික (සා/පෙළ) විභාගයෙන් එකවර විෂයන් 06 කින් සමත් වී තිබිය යුතු අතර **භාෂාව** (සිංහල/ දෙමළ/ ඉංග්‍රිසි) හා **ගණිතය** යන විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් ලබා තිබිය යුතුය.

03.5. 2019.04.18 වැනි දිනට ප්‍රථම වසර පහතක් තුළ (05) අඛණ්ඩ සහ සතුටුදායකව සේවය කර තිබිය යුතු අතර ඒ බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර තිබිය යුතුයි

03.6. අයදුම්කරු මනා චරිතයකින් හෙබි පුද්ගලයකු විය යුතුය.

03.7. සියලුම අයදුම්රුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික සහ මානසික යෝග්‍යතාවයක් හෙබි පුද්ගලයන් විය යුතුය.

**සටහන :**

(අ) යම් තනතුරක ස්ථිර පත්වීමක් ලැබීමට පෙර සේවය කරන ලද හෝ යම් තනතුරක ස්ථිර පත්වීමක් ලැබීමේ කොන්දේසි මත සේවය කර ඇති හෝ පුහුණුවක් ලැබීමේ කාලසීමාවක් වශයෙන් ඉහත 03.5 වගන්තියේ සඳහන් සුදුසුකම් ලබාගැනීම සඳහා වසර පහක කාලසීමාව ලෙස එය ගණනය කරනු නොලැබේ.

(ඇ) කුමණ හෝ තනතුරක ස්ථිර පත්විමක් ලැබිමට පෙර තාවකාලික, අනියම් පදනම මත සේවය කරන ලද කාලසීමාවන් ඉහත 03.5 වගන්තියෙහි සඳහන් සුදුසුකම් ලබාගැනීම සඳහා වසර පහක (05) කාලසීමාවක් ලෙස ගණනය කරනු ලබන්නේ නැත.

04 **බඳවා ගැනීමේ ක්‍රමය**

04.1. ලිඛිත පරීක්ෂණය මගින් හා කුසලතාව පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දි බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනිමේ ක්‍රමය ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදින්ට යටත්ව බඳවාගනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දි පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අවශ්‍යවන සුදුසුකම් නැති බවට අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම අවලංගු කරනු ලැබේ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා නොකර අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන අයදුම්කරුවන්ට

විභාගයට පෙනිසිටීමට අවසර ලබාදෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියලු සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා අමතර ලකුණු කිසිවක් ප්‍රදානය කරන්නේ නැත.

04.2. ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයම්කරුවන් ඔවුන් ලබාගත් මුලු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙල අනුව පත්වීම් ලබාදීම සඳහා තෝරාගනු ලැබේ.

05 **විභාග ගාස්තු**

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි තැපැල් කාර්යාලයක රුපියල් **500/=** ක වටිනාකමින් යුත් මුදල් ඇනවුම යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයෙන් මාරුකළ හැකි පරිදි **"ලේකම්, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ලබාගෙන එම ඇනවුම අයදුම්පතේ නියමිත කොටුවේ අමුණා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග ගාස්තුවකට මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

**06 අයදුම් කිරීමේ ක්‍රමය**

06.1. මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ( සෙමි 21 X සෙමි 29 ) ප්‍රමාණයේ කොළයක 01 සිට 4.5 දක්වා වූ කොටස් පළමුවැනි පිටුවේත්, 4.6 සිට 06 දක්වා දෙවැනි පිටුවේත් ඉතිරි ඒවා අනෙක් පිටුවේත් ඇතුලත්වන පරිදි අයදුම් පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2019.04.18 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත අංක 393/48, කෝවිල පාර, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

06.2. යොමු කරනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආදායම් පරීක්ෂක 111 වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019"** යනුවෙන් සඳහන් කළ යුතුය.

06.3. අයදුම්පතේ ඡායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාර ගනු නොලබන අතර විභාගයට අදාළ ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබීම අයදුම්කරු විසින් සියලුම සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.

06.4. අයදුම්පත්‍ර යොමු කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වීමට නියමිත දින තුනකට (03) කලින් ප්‍රවේශ පත්‍රය ලැබුණේ නැතිනම් ඒ බව දන්වා පහත සඳහන් විස්තර සමඟ **ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්වීමට කටයුතු කළ යුතුය. (දුරකතන අංකය 021- 221 9939 හා ෆැක්ස් අංකය 021- 221 9940)

**සටහන:**

ආවරණ ලිපියක්, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම් පත් අංකය, අයදුම්කරුගේ ලිපිනය, අයදුම්පත්‍රයේ පිටපතක්, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, විභාග ගාස්තු ගෙවූ ඇණවුමේ ඡායා පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ෆැක්ස් අංකය.

## 07 අනන්‍යතාවය තහවුරු කිරීම

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරන මෙන් දැනුවත් කරනු ලැබේ. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමක් හෝ එක් ලේඛනයක් පිළිගනු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමෙන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(11) වළංගු ගුවන් බලපත්‍රයක්.

ඉහත සඳහන් ලේඛනවලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවෙකුගේ හිමිකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම පිළිබඳ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට අයදුම්කරුවන් නැඹුරු විය යුතුය. එකී නීති රීතිවලට පටහැනිව කටයුතු කිරීමෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විමට සිදුවනු ඇත.

## 08 අසත්‍ය තොරතුරු සදහා දඬුවම්

අයදුම්පත සම්පූර්ණ කරන විට අවධානමින් යුතුව සත්‍ය තොරතුරු සැපයිය යුතුයි. අයදුම්කරු විසින් සපයන ලද තොරතුරුවලින් යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කළ හැකි ය.

## 09. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා සේවා ගණය **MN-1-2016** අනුව ගනු ලබන ආදායම් පරික්ෂක III වන ශ්‍රේණියට, අදාල වන මාසික වැටුප් පරිමාණය රු**: 27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660-45,540** වේ. (රුපියල් 27,740 වැටුප් තලයට එළඹීමට ප්‍රථම කාර්යක්ෂම කඩයම් විභාගය සමත්විය යුතුයි.) කෙසේ වෙතත් ඉහත චක්‍රලේඛයේ දෙවන උප ලේඛනයට අනුව වැටුප් ගෙවනු ලැබේ.

## 10. විෂය නිර්දේශය

(අ) මෙම විභාගය පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ මෙම පරික්ෂණය සිංහල හා දෙමළ යන ද්විත්ව භාෂාවලින් පවත්වනු ලැබේ අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අඅ | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතාවය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ අංක ගණිතමය හැකියාව, තර්කානුකූල හැකියාව, සමාන්‍ය බුද්ධිය යනාදිය පරික්ෂා කරන ප්‍රශ්න වලින් යුක්ත ය. | පැය 01යි | 100 යි |
| 02 | සාමාන්‍ය දැනුම | සාමාන්‍ය දැනුම හා අපේක්ෂකයාගේ තනතුර සම්බන්ධ හැකියාව යනාදිය පරික්ෂා කරන ප්‍රශ්න වලින් යුක්ත ය.. | පැය 01 යි | 100 යි |

**සටහන**

i. රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාවන් පරිකෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

ii. මෙම විභාගය තරග විභාගයක් වන බැවින් එයින් සමත් විම සඳහා එක් එක් විෂයන්ට වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු අතර එය මුලු

ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 50% ක් විය යුතුයි. මෙම තරග විභාගයට වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පූර්ණය කිරීම සඳහා ලබා ගත් මුලු ලකුණු ප්‍රමාණය පදනම් කරගෙන ලකුණු අනු පිළිවෙළට (Rank Order) පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

11. **විභාග ප්‍රතිඵල**

අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් වෙබ් අඩවියෙහි පළකරන අතර, ඉන්පසුව විභාගයට පෙනිසිටි සියලුම අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

12. මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමේ බලය "**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්**" සතු වේ. මෙම සිංහල හා දෙමළ චක්‍ර ලේඛයේ භාෂා අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක දෙමළ මාධ්‍ය චක්‍ර ලේඛය අනුව කටයුතු කරන බව සළකිය යුතුවේ.

***අ.සිබාලසුන්දරන්***
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
18.03.2019

පිටපත් :-

1 ප්‍රධාන ලේකම්, උතුරු පළාත - දැනගැනීම සඳහා
2 ආණ්ඩුකාර ලේකම්, උතුරු පළාත - දැනගැනීම සඳහා